# විනාශය කරා ගමන් කරන කුකුළුවා රජ මහා විහාරය පිළිබඳව අධ්‍යයනයක්

කුසුම්ලතා. පී.බී.අයි.කේ

## හැඳින්වීම

පුරාවිද්‍යාත්මක වශයෙන් මෙන්ම ඓතිහාසික වශයෙන් වැදගත් බොහෝ ස්ථාන ලංකාව පුරා විසිරී පවතී. එහෙත් ඒවායින් බොහොමයක් කෙරෙහි තවමත් පුරාවිද්‍යා ආයතයන්හි අවධානය යොමු වී නොමැත. ඇතමුන් එවන් වෙහෙර විහාරස්ථාන මඟින් අයුතු ප්‍රයෝජන ලබා ගනිමින් විනාශ කිරීමට තැත් කරන අතර තවත් පිරිස් එහි ඇති වටිනාකම වටහාගෙන අනාගතයට රැක ගැනීමට කටයුතු කරයි. තවත් එවන් අවධානයට ලක් නොවී විනාශ වීගිය විහාරස්ථානයක් වශයෙන් කුකුළුවා රජමහා විහාරය පෙන්වාදිය හැකි වේ. කුකුළුවා රජමහා විහාරය පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන්නේ ද යන්න හා එවන් වැදගත්කමක් හිමි කරගෙන තිබූ විහාරස්ථානයක් අවධානයට ලක් නොවී විනාශයට යාමට හේතු කවරේ ද යන්න විමසා බැලීම යන අධ්‍යයන ගැටලුව මුල් කරගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ඒ සඳහා අරමුණු කරගනු ලැබුවේ මෙතෙක් අවධානයට ලක් නොවූ මෙම විහාරයේ ආරම්භය, විකාශනය පිළිබඳව අධ්‍යයනය කිරීම ප්‍රධාන විය. ඊට අමතරව පුරාවිද්‍යාත්මක වශයෙන් විහාරය අත්කරගෙන ඇති වටිනාකම කෙබඳු ද යන්න සොයා බැලීමත් , විහාරය පිළිබඳව දත්ත රැස් කරමින් මෙතෙක් හඳුනා නොගත් පුරාවස්තූන් පිළිබඳව අධ්‍යයනය කිරීමත්, අවධානයෙන් බැහැරව ඇති මෙකී විහාරස්ථානය පිළිබඳ තවත් අධ්‍යයනය කරන්නෙකුට යම් හෝ දැනුමක් ලබා ගැනීමටත් මහ ජනතාවගේ අවධානය මෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු තවත් ආයතන යම් හෝ තරමින් දැනුවත් කිරීම අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. අති දුෂ්කර ස්ථානයක පිහිටි මෙම විහාරය පිළිබඳ අධ්‍යයනය කිරීමට මෙතෙක් කිසිවෙකු හෝ කටයුතු කර නොමැත. ඒ අනුව අධ්‍යයනය සඳහා දත්ත රැස් කරනු ලැබුවේ ප්‍රථමයෙන් සිදු කරන ලද ගවේශනය ප්‍රධාන විය. එහිදී හඳුනාගත් දත්ත කෙරෙහි අවධානය යොමු කරමින් අධ්‍යයනය සිදු කරන ලදී. මේ සඳහා ප්‍රවේශ වීමට පුස්තකාල ගවේශනය ඉතා වැදගත් වූ අතර පුළුල් විස්තරයක් එමඟින් ලබාගත නොහැකි වුව ද පූර්ව දැනුමක් ලබා ගැනීමට එය මහත් පිටිවහලක් විය. ඊට අමතරව වර්තමාන විහාරාධිපති හා අවට ප්‍රදේශවාසීන්ගෙන් ලබාගත් තොරතුරු ද මෙම අධ්‍යයනයට යොදා ගනු ලැබිණි.

## සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුකුළු කෝරලේ පල්ලේ පත්තුවේ පිඹුර ග්‍රාමයට අයත් උඩු කන්ද නැමති පෞරාණික ගම් පියසට උතුරින් නිරි ඇල්ල නම් කඳු වැටියේ දකුණු බෑවුමේ මෙම ලෙන් විහාරය පිහිටා තිබේ. එමෙන්ම නවදුන් කෝරලය හා කුකුළු කෝරලය වෙන්වන සීමාවේ දෙකෝරලයටම පොදුවන ලෙස පිහිටා තිබේ. විහාරයට ප්‍රවේශවීමට ප්‍රවේශ මාර්ග දෙකක් වේ. එනම් පිඹුර මාර්ගය, මෙම විහාරයට පිවිසීමට ප්‍රධාන වශයෙන් මෙම මාර්ගය භාවිත කළ හැකි වේ. නිරිඇල්ල මාර්ගයට සම්බන්ධ වී තවත් මාර්ගයක්වන අතර ඒ කරවිට මාර්ගයයි. මෙම විහාරයට පිවිසීමට ඇති අනෙක් මාර්ගය වන්නේ ,පිඹුර මාර්ගයයි. එයට කලවාන මාර්ගය හා සම්බන්ධ වීමෙන් ද ළඟා විය හැකි වේ. මෙම මාර්ග අතුරින් පිඹුර මාර්ගය විශේෂ වන බව බොහෝ දෙනෙකුගේ මතයවන අතර එයට හේතුව ලෙස ඔවුන් පවසන්නේ වළගම්බා රජ දවස මෙම විහාරස්ථානයට ගමන් කිරීමට මෙම මාර්ගය භාවිතකළ බවත් එය රජ මානත ලෙස සලකන ලද බවත් ය. කෙසේ වෙතත් මෙවන් ප්‍රවේශ මාර්ග තිබුණ ද කුකුළුවා රජ මහා විහාරය වෙත ලඟා වීම පහසු කාර්යයක් නොවේ. (අභයවර්ධන 2001).

මෙම විහාරස්ථානයේ ආරම්භය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී වළගම්බා රජු

සතුරන් සමඟ යුධ වැදී ඉන් පරාජයට පත්ව අවුත් මෙහි ගල් ගුහාවක සැඟව සිටි බවට සඳහන් වේ. එකල රජු ජනතාව සමඟ ඒකරාශී වූ බවත් සඳහන් වේ. තවත් ඇතමුන් පෙන්වා දෙන්නේ වළගම්බා රජු කුඩා කාලයේ සිටම මෙම ගල්ලෙනෙහි වාසය කිරීම පිළිබඳවයි. එලෙස ආරම්භ වූවායැයි පැවසෙන කුකුළුවා රජමහා විහාරය එනමින් හැඳින්වීම පිළිබඳව ද විවිධ මතවාද පවතී. ඇතමුන්ගේ මතය වූයේ මෙම විහාරය ආසන්නයේ බහුලව කුකුළන් වාසය කිරීම මත කුකුළුවා විහාරය වශයෙන් සලකන බවයි. කුකුළු කෝරලයේ පිහිටා තිබීම නිසා එලෙස නම්කර ඇති බව ඇතමුන් පෙන්වා දී තිබේ. එමෙන්ම විහාරය ගොඩනගා ඇත්තේ කුකුළකුගේ හැඩයට අනුවයි. එබැවින් ද මෙම විහාරය කුකුළුවා විහාරය ලෙස සලකා තිබේ.

කෙසේ හෝ මෙලෙස ආරම්භව ඇති කුකුළුවා රජමහා විහාරය විවිධාකාරයෙන් වර්ධනයට ලක්ව ඇත. වළගම්බා රජුගෙන් පසුව විනාශ මුඛයට පත් ව ඇති අතර නඩත්තුවට කිසිවෙකු නොමැතිකම මත වනයෙන් වැසී ගොස් තිබුණි. නැවත විහාරය පිළිබඳව අවධානය යොමු වන්නේ කැලෑ කැපීමට ගිය අයකුගේ නෙත ගැටී ඒ බව භික්ෂූන් වහන්සේ නමකට දැන්වීමෙන් පසුවයි. එම භික්ෂූන් වහන්සේගේ මූලිකත්වයෙන් විහාරය පිළිබඳ අවධානය යොමු කළ අතර ඒ වන විටත් විහාරය සතු බොහෝ දෑ විනාශ වී ගොස් තිබේ. භික්ෂූන් වහන්සේට වැඩ වාසය කිරීමට තරම් හෝ ස්ථානයක් එහි නොමැති විය. නැවත වරක් මෙම විහාරස්ථානය කෙරෙහි අවධානයට යොමු කරන ලද්දේ දැලිවල සද්ධාතිස්ස නම් හිමි නමකි. උන් වහන්සේ යටතේ මෙතෙක් පැවති විහාරස්ථානය බොහෝ දුරට වැඩිදියුණු කරන ලදී. මෙලෙස සංවර්ධනයට ලක්ව පැමිණි මෙම විහාරස්ථානයේ කොස්වත්තේ ඥානසාර නම් හිමි නමක් යටතේ සංවර්ධනය වූ අතර එකල අනුරාධපුර ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් මෙම කුකුළුවා විහාරයේ රෝපණය කළ බව ද ජනප්‍රවාදගත තොරතුරු අතර වේ. ඥානසාර හිමියන් විසින් මෙම විහාරයේ ධර්ම ශාලාවක් නිර්මාණයට කටයුතු කරන ලදී. බණ ශාලාවේ කණු 04ක් අල්ලා ලෑලි සවිකර කුඩා කුටියක් ගොඩනගා ගෙන එහි වැඩ වාසය කරන ලදී. පසුව මෙම භික්ෂුව විසින් විශාල ගල් පර්වතයක් මධ්‍යයේ චෛත්‍යයක් ඉදිකරන ලදී. ජනප්‍රවාදගත තොරතුරුවලට අනුව එය අඩි 27ක් උස වේ. ගල් පර්වතය තුළින්ම චෛත්‍යයට ළගා වීම සඳහා පඩි පේළියක් නිර්මාණයකර තිබේ.

මෙතෙක් පැවතියා වූ තත්ත්වයන් අභියෝග හමුවේ මෙම විහාරස්ථානයේ විහාරාධිපති වශයෙන් රත්නපුර සීවලී නාහිමියන් පත් වූ අතර උන් වහන්සේ යටතේ තව දුරටත් යම් සංවර්ධනයන්ට ලක් විය. යම් යම් ආකාරයට නව ඉදිකිරීම් ද සිදුකරමින් අදවන විට සැලකිය යුතු මට්ටමක දියුණුවක් ලබා තිබේ. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් ඉහළ වැදගත්කමක් උසුලන කුකුළුවා රජමහා විහාරය තුළ විවිධ ඉදිකිරීම් කිහිපයක් ම හඳුනාගත හැකි වේ.

- සැතපෙන බුදු පිළිම වහන්සේ
- උමං මාර්ගය
- බෝ සමිඳු
- ගල් උළුවස්ස
- නාථ දේවාලය
- දාගැබ් වහන්සේ
- ගිරි ලිපිය
- බුදු පිළිම වහන්සේ
- විනාශ වී ගිය චිත්‍ර
- ලෙන්

ආදිය වැදගත් වන අතර ඒ පිළිබඳව ජනප්‍රවාදගත තොරතුරු මෙන්ම යම් යම් මූලාශ්‍රයන්ගෙන් ලබා ගන්නා තොරතුරු ද වැදගත් වේ.

මෙම විහාරස්ථානය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක අවශේෂ පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එහි තිබී විනාශයට ගොස් ඇති චිත්‍ර ඉතා වැදගත් වේ. විහාරයේ ආරම්භයත් සමඟ ගල් ගුහාවේ ඉහළ කොටස චිත්‍රවලින් අලංකරණය කර තිබූ බවට ජනප්‍රවාදයේ වේ. ගල්ලෙන් හා උඩු පියස්සේ ඇඳ තිබූ සිතුවම් කෝට්ටේ යුගයට අයත්වන බවට අනාවරණය කරගෙන ඇති අතර අදවන විට මුළුමනින්ම විනාශ වී

ගොස් තිබේ. සිතුවම් ඇඳි ගල් පරික්ෂා කිරීමෙන් ඒවා කුමන කාලයකට අයත් ද යන්න හා භාවිත ද්‍රව්‍ය ආදිය පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකි වේ.

විහාර පරිශ්‍රයේ දැකගත හැකි පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් සාධකයක් ලෙස ගිරි ලිපිය පෙන්වාදිය හැකි වේ. එම ලිපිය වළගම්බා රාජ්‍ය තරම් ඈතට දිවෙන බව සැලකේ. (ලියනගේ 2002). මෙම විහාරයට චෛත්‍ය නිර්මාණයකර එයට පිවිසීමට ගලින්ම කරන ලද පඩිපෙළ නිර්මාණය කිරීමේ දී නොදැනුවත්කම නිසාවෙන් විනාශ වී තිබේ. ඒ තත්ත්වය මත ලිපිය කියවීමට නොහැකි වන පරිදි විනාශ වී ඇති අතර 2007 වසරේ සෙනරත් වික්‍රමසිංහ මහතා ප්‍රකාශකර සිටියේ මෙම ලිපිය ක්‍රිස්තු වර්ෂ 9-10 අයත් විය හැකි බවයි. මෙහි අකුරු කිහිපයක් පමණක් ඉතිරි වී ඇති අතර ඒවාද අද වන විට එතරම් පැහැදිළි තත්ත්වයක නොමැත. විනාශ වීමෙන් අනතුරුව ලිපිය පිහිටි ස්ථානය කොටුකර දක්වා තිබේ. (ජයසේකර 2004).

විහාරයේ පුරාවිද්‍යාත්මක වටිනාකම විදහාලන සාධකයක් වශයෙන් ලෙන් හඳුනාගත හැකි වේ. අතීතයේ බොහෝ භික්ෂූන් වාසය කරනු ලැබුවේ ලෙන් ආශ්‍රිතවයි. එකී ලෙන් මුල් කරගෙන විවිධ ගොඩනැගිලි නිර්මාණ කරන ලදී. ඒ අනුව ලෙන් විහාර ඉතා වැදගත් වේ. කුකුළුවා රජමහා විහාරයේ බොහොමයක් ගොඩනැගිලි නිර්මාණය කර ඇත්තේ ලෙන් ආශ්‍රිතවයි. වළගම්බා මුලින්ම මෙම ලෙනෙහි වාසයකොට පසුව එය මුල්කරගෙන විවිධ නිර්මාණ ඉදි වී තිබේ. ලෙන් විහාර නිර්මාණයේ දී ගල් පියසේ කටාරම් කොටා ලෙන තුළට වැසි ජලය ගලා ඒම වළක්වා තිබේ. කටාරමට යටින් පියස්සට අල්ලා වහල සහිතව නිර්මාණය කර තිබේ. මේ අනුව කුකුළුවා රජමහා විහාරයේ පුරාවිද්‍යාත්මක අවශේෂ අතර වාස්තුවිද්‍යාත්මක වශයෙන් ද වැදගත් වූ ලෙන් නිර්මාණය ඉතා වැදගත් වේ. (එම).

මෙම විහාරය තුළ වූ සැතපෙන බුද්ධ ප්‍රතිමාව ද ඉතා වැදගත් වේ. විහාරය තුළ වන දැනට ශේෂව ඇති වැදගත්ම පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස මෙම සැතපෙන බුදු පිළිමය හඳුනාගත හැකි වේ. බුදුන් වහන්සේගේ සැතපෙන මුද්‍රාව මෙයින් නිරූපණය කෙරේ. මෙම බුදු පිළිමය දැකගත හැකි වන්නේ විහාරයේ ලෙනෙහි වම් පැත්තට වන්නයි. දිගින් අඩි 35 ක් හා උස අඩි 7-5 ක් පමණ වේ. සුවිශේෂී රැස් වළල්ලක් හා සිරසෙහි ඡත්‍රයක් නිර්මාණයකර තිබේ. කෙසේ වෙතත් වර්තමාන ප්‍රතිසංස්කරණ හේතුවෙන් එහි පුරාවිද්‍යාත්මක වටිනාකම විනාශ වී ගොසින් ය. මෙම පිළිමය සීතාවක යුගයට ප්‍රථමව නිර්මාණය කරන ලද්දක් බව පැවසේ. මන් ද ප්‍රතිමාව නිර්මාණය කිරීමේ දී ඒ තුළට කොස් කඳක් දමා නිමවා තිබූ බවට තොරතුරු වේ. (එම). 1897 දී මෙම බුද්ධ ප්‍රතිමාව නිධන් සොරුන් විසින් කඩා විනාශ කරන ලදී. ඒ තුළ තිබී නිධන් වස්තු සොරා ගැනීමට කටයුතු කිරීම නිසා කිහිප වතාවක්ම ප්‍රතිමාවට හානි සිදුකර තිබුණි. කෙසේ වෙතත් වර්තමානය වන විට මෙම ප්‍රතිමාව අලංකාරවත්ව නිමවා ඇතත් ඒ තුළින් පුරාවිද්‍යාත්මක වටිනාකම ගිලිහි ගොස් ඇත.

විහාර මන්දිරයේ සැතපෙන බුදු පිළිම වහන්සේගේ සිරි පතුල අසල උමං මාර්ගයක් දක්නට ලැබේ. ලෙන තුළ බිත්තියේ හරස් අතට වන්නට මෙය දැකගත හැකි වේ. වළගම්බා රජ දවස මෙම උමං මාර්ගය ඉදිකරන ලද බව බොහෝ දෙනා ප්‍රකාශ කරති. මෙම උමං මාර්ගය කුකුළුවා විහාරයේ සිට රත්නපුර පොත්ගුල් විහාරයට යා කර ඇති බවත් ආරක්ෂාකාරීව ගමන් කිරීමට මෙය ඉදිකර ඇති බවත් ජනප්‍රවාදයේ වේ. අදවන විට එය සම්පූර්ණ වශයෙන් දැකගැනීමට නොහැකි අතර යම් තරමකට උමං මාර්ගයක් බව හඳුනාගත හැකි වේ. එමෙන්ම එය දැලකින් ආවරණය කර තිබේ.

විහාර පරිශ්‍රය තුළ තිබී සොයාගන්නා ලද ගල් උළුවස්ස පිළිබඳව ද ජනප්‍රවාදගත තොරතුරු බොහෝ වේ. වළගම්බා රාජ්‍ය සමය තෙක් කාලයට දිව යන බවට තොරතුරු වේ. (ජයසේකර 2004). විහාර ගෙය අලුත්වැඩියා කරන සමයක එය ගලවා ඉවත්කරන ලද බව සැලකේ. අදවන විට එය සංවර්ධනයකර විහාර ගෙට සවිකර තිබේ. විශාල ගල් පර්වතයක් මතින් ඉහළට ගමන් කිරීමෙන් පසු ඒ තුළ චෛත්‍ය ඉදිකර තිබේ. මේ පිළිබඳව තොරතුරු

පෙන්වාදෙන ජනප්‍රවාදගත තොරතුරු විවිධාකාරයෙන් ගෙනහැර දක්වන අතර බොහෝ දෙනෙකු පෙන්වාදෙන්නේ සියම් කුමාරයකු ලංකාවට පැමිණ ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් මෙලෙස කුකුළුවා විහාරයට රැගෙන රෝපණය කරන ලද බවට ජනප්‍රවාදයේ එයි. 2503 දී මෙම බෝ සමිදු වැඩමවන ලදී. මෙම බෝ සමිදුගේ මහා අනුහස් පවතින බවත්, ජනතාව මෙම භූමියට ඇද බැඳ ගැනීමට දෙනයන නිති සැනසවීමට හැකියාව ඇති බව ජනයාගේ අදහස් වේ. ඒ බව සනාථ කරන ජනයා ප්‍රකාශ කරනුයේ දිනක් බෝ ගසෙහි පිළිලයක් සෑදී තිබූ අතර එය ඉවත් කිරීමට අයකු බෝ ගසට නැගි අතර ඔහු පසුව රෝගී වූ බවට තොරතුරු ජනප්‍රවාදයේ වේ. ඇතමුන් ප්‍රකාශ කලේ එය මෑත කාලයේ රෝපණය කරන ලද්දක් වන බවයි. කෙසේ වෙතත් වර්තමාන විහාරාධිපති ලෙස කටයුතු කරන සීවලී හිමියන් විසින් රන් වැටකින් වටකර ආරක්ෂාකර තිබේ. (එම).

වර්තමානයේ ද විවිධ අභිචාර විධි විහාරය ඇසුරු කරගෙන සිදුකරන ලද බව පෙනේ. මෙම විහාරය ආශ්‍රිත භූමියට අධිපති දෙවියන් ලෙස සැලකෙන සමන් දෙවියන් ඉතා ගෞරවයෙන් වන්දනයට ප්‍රාප්ත වේ. එම දෙවියන්ගේ රැකවරණය කුකුළුවා රජමහා විහාරයට ලැබෙන බව විශ්වාසයයි. එමෙන්ම නාථ දෙවියන්ට වන්දනාමාන කිරීම ද සිදු වේ. ඒ සඳහා විහාර පරිශ්‍රයේ නාථ දේවාලයක් ඉදිකර තිබේ.

විහාරයේ ඉහළම තැන පිහිටා ඇති අතර එහි ආකෘතිය කවරාකාර ද යන්න නිසියාකාරව හඳුනාගෙන නොමැති අතර බුබ්බුලාකාර හෝ ඝණ්ඨාකාර ආකෘතියක් ගන්නා බව පවසයි. මෙයට පිවිසීමට කළු ගලින්ම නිමවන ලද පඩි පෙළකි. මෙම දාගැබ් වහන්සේ වළගම්බා රාජ්‍ය සමය තුළ ඉදි වූවක් වන බවට ඇතමුන් ප්‍රකාශ කරන අතර විනාශයෙන් අනතුරුව ඉතිරි වූ ශේෂයන් මගින් නැවත මෙමම ස්ථානයේ චෛත්‍ය ඉදිකරන්නට ඇති බව පැවසේ. සත්‍ය කෙසේ වෙතත් කුකුළුවා විහාරය පිළිබඳව අධ්‍යයනයට සිදුවූයේ වැඩි වශයෙන් ජනප්‍රවාදගත තොරතුරු මුල් කරගෙනයි. ජනප්‍රවාදගත තොරතුරු මත මෙම දාගැබ මෑත කාලයේ එනම් ඥානසාර නම් හිමි නමක් විහාරාධිපති වශයෙන් කටයුතු කරන කාලයේ එය ගොඩනගා ඇති බවයි.

කුකුළුවා රජමහා විහාරය මෙරට පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් වූවක් වන අතර බොහෝ තොරතුරු ලබා ගැනීමේ දී අද පවතින විහාර භූමිය ගවේශනය කිරීම මගින් හා බොහොමයක් ජනප්‍රවාදගත තොරතුරු ඇසුරුකර ගනමිනි. එහි දී ඉතාම අඩු තොරතුරු ප්‍රමාණයක් පමණක් මූලාශ්‍රගත තොරතුරු අතර විය. කෙසේ වෙතත් මෙම තොරතුරු ඔස්සේ විමසා බැලීමේ දී ජනප්‍රවාදයේ එන තොරතුරු මත විහාරයේ ඉතිහාසය වළගම්බා රාජ්‍ය සමය තෙක් දිවගිය ද යන්න සත්‍ය වශයෙන්ම කිව නොහැකි වන්නේ එම තොරතුරුවල ඇති විශ්වසනීයත්වය මතයි. එය කෙසේ වුව ද විහාරයට ඈත ඉතිහාසයක් පවතින බව එයින් පැහැදිලි වේ.

පුරාවිද්‍යාත්මක වශයෙන් විහාරයට ඇති වටිනාකම කෙතරම් ද යත් විශාල ගල් පුවරුවේ හමු වූ සෙල්ලිපියේ අක්ෂර පරීක්ෂාකර බැලීමේ දී ඒවා අනුරාධපුර රාජ්‍ය සමය තෙක් පැරණි බව පැහැදිලි වේ. එමෙන්ම විශාල ලෙන මගින් ද කිව හැක්කේ මෑත කාලයට වන්නට භික්ෂූන් වහන්සේලා පන්සල්, විහාර කුටි, ආදි ගොඩනැගිලි ඉදිකරගෙන තිබූ අතර ගල් පර්වතයන්හි ලෙන් භාවිතයට ගනු ලැබුවේ මුල් කාල පරිච්ඡේදයේදීය. උදාහරණ වශයෙන් දේවානම්පියතිස්ස රාජ්‍ය සමය තුළ මිහින්තලේ අට සැට ලෙන් කරවා භින්ෂූන්ට පූජාකරන ලද බවට තොරතුරු වේ. ඒ අනුව මෙම විහාරයේ වූ විශාල ලෙන ඉතා පැරණි බව ද පැහැදිලි වේ. වැඩි වශයෙන් කළුගල් භාවිතයෙන් ගොඩනැගිලි ඉදිකරනු ලැබුවේ අනුරාධපුර යුගයේ වන අතර විහාර පරිශ්‍රයෙන් හමු වී දැනට සංවර්ධනයට ලක්කර ඇති ගල් උළුවස්ස ද එතරම් ඉතිහාසයකට උරුමකම් කියන්නට ඇති බව සිතිය හැකිය. මෙවන් තොරතුරු හෙළි වීමෙන් කුකුළුවා රජමහා විහාරය ඓතිහාසික වශයෙන් මෙන්ම පුරාවිද්‍යාත්මක වශයෙන් ද වටිනාකම් හිමිකරගත් විහාරයක් බව පැහැදිලි වේ.

මෙවන් පුරාවිද්‍යාත්මක වශයෙන් මෙන්ම ඓතිහාසික වශයෙන් වැදගත්කම් රැසක් හිමිකරගත් කුකුළුවා රජමහා විහාරය සතු වූ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ගොඩනැගිලි බොහොමයක්ම විනාශ වී ගොස් ඇති අතර ඒ කෙරෙහි විවිධ හේතූන් බලපා තිබේ. මානව ක්‍රියාකාරකම්, දේශගුණික විපර්යාසන් මෙන්ම අදාළ බලධාරීන්ගේ අවධානය යොමු නොවීම ආදී හේතූන් ඒ කෙරෙහි බලපා තිබේ. මෙවන් තත්ත්වයන් අනාගතයේදීත් තවදුරටත් සිදු නොවීමට නම් විනාශය කරා ගමන් කරන මෙවන් ගොඩනැගිලි කෙරෙහි අවධානය යොමු කිරීම, පවතින තත්ත්වය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම හා නඩත්තුවක් පවත්වාගෙන යාම, ජනතාවට ඒවායේ ඇති වටිනාකම් පහදා දීම ආදී යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් එවන් විනාශයන් යම් කරමකින් හෝ වළකාලිය හැකි වේ.

**සාරාංශය**

ලංකාව පුරා විසිරී ඇති ඓතිහාසික වශයෙන් මෙන්ම පුරාවිද්‍යාත්මකව වටිනාකම් හිමිකරගත් බොහෝ වෙහෙර විහාරස්ථාන වේ. ඒ අතරින් බොහොමයක් කෙරෙහි පුරාවිද්‍යා ආයතන හා නිලධාරීන් මෙන්ම ඒ කෙරෙහි අවධානය ලක් විය යුත්තන්ගේ අවධානය ලක් වූව ද එලෙස අවධානයෙන් මග හැරී ඇති වෙහෙර විහාරස්ථාන බොහොමයක් ලංකාව පුරා විසිරී පවතී. ඉතා දිගු ඉතිහාසයකට උරුමකම් කියන තවත් එවන් විහාරයක් වශයෙන් කුකුළුවා රජමහා විහාරය හඳුනාගත හැකි විය. මෙම විහාරය පිළිබඳව වැඩි වශයෙන් තොරතුරු ලබාගත හැකි වන්නේ ජනප්‍රවාද සමඟිනි. මෙලෙස ලබාගත් තෙරතුරු මුල්කරගෙන විහාර පරිශ්‍රය අධ්‍යයනයෙන් සෙල්ලිපි නටබුන්, ගල් උළුවස්ස, උමං මාර්ගය, ගල් ලෙන, විනාශ වී ගිය චිත්‍ර නටබුන්, මෙන්ම චෛත්‍ය, බෝධීන් වහන්සේ , දේවාලය, ආදී බොහොමයක් ගොඩනැගිලි මගින් මෙම විහාරය සතු වූ පුරාවිද්‍යාත්මක වටිනාකම මොනවට පැහැදිලි වේ. නමුත් එවන් වටිනාකමක් උරුම කරගන්නා ලද විහාරස්ථානය පිළිබඳව නිලධාරීන්ගේ හෝ කිසිදු ආයතනක අවධානයට ලක්ව නොමැත. මෙතෙක් හෝ විහාරය පැවත ඇත්තේ එක් එක් භික්ෂූන් වහන්සේලා යටතේ එය හැකි පමණින් නඩත්තුකරමින් පවත්වාගෙන ඇති හෙයිනි. විහාරය ආරම්භක අවස්ථාවේ වූ වටිනාකම නොයෙක් විනාශයන් හා සංවර්ධනයන් නිසාවෙන් අවම වී ඇති අතර එහෙත් වර්තමානය වන විට ආරක්ෂා වී ඇති තත්ත්වය හෝ ඉදිරියට ආරක්ෂාකර පවත්වාගෙන යාමට කටයුතු කිරීමෙන් තවත් උරුමයක් වැනසී යාම වළකාලිය හැකි වේ.

## ආශ්‍රිත මූලාශ්‍ර


- ලියනගේ,බී.(2002).රත්නපුරයේ ජනප්‍රවාද , විශ්වලේඛා ප්‍රකාශනය.
- අභයවර්ධන,එච්.ඒ.පී.(2001). සබරගමු ප්‍රවේණිය ප්‍රමුඛ ස්වභාවික සංස්කෘතිය හා ඓතිහාසික ස්ථාන, සබරගමු සංවර්ධන බැංකු ප්‍රකාශනය.
- සබරගමු වංශකතාව 1 වෙළුම. (2003). සබරගමු පළාත් සභා ප්‍රකාශනය.
- සබරගමු වංශකතාව 2 වෙළුම. (2003). සබරගමු පළාත් සභා ප්‍රකාශනය.
- ජයසේකර,කේ. (2004). කුකුළු කෝරලේ විත්ති.


## සම්මුඛ සාකච්ඡා

- ඩබ්.එච්.එස්.විජේසුන්දර ,අයගම,කලවාන. (වයස - අවුරුදු 62)
- ඊ.එස්.කරුණාදාස ,අයගම,කලවාන. (වයස - අවුරුදු 68)
- ජේ.කේ.එස්.ඩී.සිල්වා ,පිඹුර,කලවාන. (වයස - අවුරුදු 70)
- රත්නපුරේ සිවලී හිමි , කලවාන.